# ගොබ් ඉරුදින

**දේව ප්‍රකාශන**

29-03-15

## ගොබ් ආසිරි ගැන්වීම

මාක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි. මාක් 11:1-10

**සමිඳාණන්ගේ නාමයෙන් වඩනා මෙතුමෝ ආසිරි ලද්දෝ ය.**

ඔව්හු ජෙරුසලමට ළං ව ඔලීව කන්දට නුදුරු බෙත්පාගයට හා බෙතානියට පැමිණියහ. උන් වහන්සේ සිය ශ්‍රාවකයන් දෙදෙනෙකු යවමින්, "ඔබ ඉදිරියේ ඇති ගමට යන්න; ගිය කෙණෙහි ම කිසිවෙකු කිසි කලක නොනැඟුණු, බැඳ සිටින කොටළු නාම්බෙකු ඔබට සම්බ වනු ඇත; ඌ ලිහා මෙහි ගෙනෙන්න. 'ඔබ මෙය කරන්නේ මන්දැ'යි යමෙකු ඇසුවොත්, 'සමිඳාණන් වහන්සේ හට උගෙන් වැඩක් ඇත; නොපමාව ඌ ආපසු එවනු ඇතැ'යි ඔවුන්ට කියන්නැ"යි වදාළ සේක. ඔව්හු ගොස්, දොර ළඟ පිටත වීදියෙහි දිගේලි කොට සිටි කොටළු නාම්බෙකු දැක ඌ ලිහුවෝ ය. එහි සිටි අයගෙන් ඇතැමෙක් කතා කොට, "කොටළු නාම්බා ලිහන්නේ මන්දැ"යි ඇසූහ. ජේසුස් වහන්සේ වදාළ ලෙසම ඔව්හු ඔවුන්ට පිළිතුරු දුන්හ. එවිට ඔව්හු ඔවුන්ට ඉඩ දුන්නෝ ය. ඔව්හු කොටළු නාම්බා ජේසුස් වහන්සේ වෙතට ගෙනවුත් තමන්ගේ උතුරු සළු ඌ පිට එළාලූ හ. උන් වහන්සේ ද ඌ පිට හිඳගත් සේක. එවිට බොහෝ දෙනෙක් තමන්ගේ සළු ද, අන් අය වතුපිටිවලින් කපා ගත් කොළ අතු ද මඟ අතුළෝ ය. පෙරටුවෙන් හා පිටුපසින් ගිය අය "හෝසන්නා! සමිඳුන් නමින් වඩිනා මෙතුමාණන් හට ආසිරි වේ වා!, අපේ පිය වූ දාවිත්ගේ මතු පැමිණෙන රාජ්‍යයට ආසිරි වේ වා!, අති උසස් තැන්හි හෝසන්නා!" කියා මොරගැසූහ.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

## පෙරහැර සඳහා ගීතිකාව

ක්‍රිස්තු රජාණන්ට ස්තෝත්‍ර වේවා සෑම කල්හී ජය වේවා
හෝසන්නා /// ක්‍රිස්තු රජාණෙනී....

දෙවියන් වහන්සේගේ නාමයෙන් පැමිණෙන තැනැතැතාණෝ
සදාකාලයටම ආරාධිත වේවා....

ස්වාමිනී, අපි ඔබවහන්සේට නමස්කාර කරමු
අපි ඔබවහන්සේට සේවය කිරීමට කැප වන්නෙමු....

ජේසුනී අපේ ගැළැවුම් කාරයාණෙනී
අපේ හෘදයන් තුළ ඔබ ආණ්ඩු කරන සේක්වා....

ජේසුස් ක්‍රිස්තුනී දේව කුමාරයාණෙනී
අප හෘදයන්හි ඔබ රජකම් කරන සේක්වා....

## පළමුවන දේව ප්‍රකාශනය

යෙසායා 50:4-7

යෙසායා දිවැසිවරයාගේ පොතෙන් උපුටා ගත් කොටයකි.

**(මගේ මුහුණ නින්දවලින් ඉවත හරවා නොගතිමි.)**

විඩාවට පත්වූවන් ශක්තිමත් කරන පිණිස ගුරුවරයෙකු මෙන් මා කිව යුතු දේ ගැන සිසුවෙකු මෙන් එතුමන්ට සවන් දෙනු පිණිස, මහෝත්තම දෙවි සමිඳාණෝ හැම උදයකම මා තුළ උනන්දුවක් ඇති කරවන සේක. දෙවි සමිඳුන් මාගේ කන් පහදූ ඇත. මා එතුමන්ට විරුද්ධව කැරළි ගැසුවේ වත් එතුමන්ට පිටුපා ගියේවත් නැත. මට පහර දෙන්නන්ට මම මාගේ පිට පෑවෙමි. මාගේ රැවුල් ගස් උදුරන්නන්ට මම මුහුණ දුන්නෙමි. මාගේ මුහුණ නින්දවෙනුත් කෙළ ගැසීමෙනුත් හරවා නොගතිමි. මහෝත්තම දෙවි සමිඳාණන් මට උපකාර කරන බැවින් මම වියවුල් නොවන්නෙමි. මම නිර්භීත ලෙස මුහුණ පාන්නෙමි. මා ලජ්ජාවට නොපැමිණෙන බව දනිමි.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තුති වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 22:7-8, 16-19, 22-23

පිළිතුර: මාගේ දෙවියනී, මාගේ දෙවියනී, ඔබ මා අත්හැරියේ මන්ද?

ගීය: සියල්ලෝ මා දෙස බලා, කවටකම් කරති. දත නියවා, හිස වනා මෙසේ කියති. "සමිඳුන්ට ඔහු භාරවිණි. එතුමන් ඔහු ගළවා නොගන්නේ මන්ද? සමිඳුන්ට ඔහු ප්‍රියමනාප විණි. එතුමන් ඔහු මුදා නොගන්නේ මන්ද?"

මන්ද, නපුරු මිනිස්සු බලු රැළක් මෙන් මා වට කර ගත්තෝ ය. මැරවරයෝ රැළක් මා වටලා ගත්තෝ ය. ඔව්හු මාගේ දෑත් දෙපා සිදුරු කළෝ ය. මාගේ ඇටකටු ගණන් කළ හැකි තරමට පෑදී ඇත. සතුරෝ මා දෙස රවා ඔරවා බලති.

මාගේ වස්ත්‍ර තම තමන් අතර බෙදා ගනිති. මාගේ සළුව ගැනීමට දාදු දමති. හිමි තුමාණෙනී, මා හැරදමා ඈත් නොවනු මැනවි. මාගේ බලය වන ඔබ මට පිහිට වන්නට කඩිනම් වුව මැනව.

ඔබේ නාමය මාගේ සහෝදරයන්ට ප්‍රකාශ කරන්නෙමි. බැතිමතුන්ගේ සභාවේදී ඔබට ප්‍රශංසා කරන්නෙමි. හිමි සමිඳාණනට ගරු බිය ඇත්තෙනි, එතුමන් පසසන්න. ජාකොබ් වංශයේ සියල්ලෙනි, එතුමන්ට ගෞරවය දෙන්න. ඊශ්‍රායෙල් වංශයේ සියල්ලෙනි, එතුමන් ඉදිරියෙහි ගරු බියෙන් සිටින්න.

## දෙවන දේව ප්‍රකාශනය

පිලිප්පි 2:6-11

පාවලු තුමන් විසින් පිලිප්පිවරුන්ට ලියන ලද හසුනෙන් කොටසකි.

**(ජේසුස් වහන්සේ යටහත් පහත් වූ හෙයින් සියල්ලට වඩා උසස් කරනු ලැබූ සේක.)**

ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ ස්වරූපය දැරූ නමුත්, දෙවියන් වහන්සේ හා සමානත්වය තමන් විසින් බදාගෙන ම තබාගත යුතු වස්තුවකැ යි නොසිතා, තමන් වහන්සේ ම ත්‍යාජ කරගනිමින්, වහලෙකුගේ ස්වරූපයක් ගෙන, අප හා සමාන මිනිස් කෙනෙක් වූ සේක. මනුෂ්‍යාකාරයෙන් සිටිමින්, උන් වහන්සේ,

මරණය, එනම් කුරුසියේ මරණය දක්වා, පහත් වී කීකරු වූ සේක. එබැවින් දෙවියන් වහන්සේ උන් වහන්සේ අති උසස් තැනට නංවා, සියලු නාමයන්ට වඩා අග්‍ර නාමය උන් වහන්සේට දුන් සේක. එසේ කළේ, ස්වර්ගයෙහි ද පොළොවෙහි ද, පාතාල ලෝකයෙහි ද සියල්ලන්, 'ජේසුස්' යන නාමයට දණ නමන පිණිසත්, ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ සමිඳාණන් වහන්සේ යයි දෙව් පියාණන් වහන්සේගේ මහිමය සඳහා, සෑම දිවකින් ම ප්‍රකාශ කරන පිණිසත් ය.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## සුපුවත් ජය නද

පිලිප්පි 2:8-9

ක්‍රිස්තුස් වහන්සේ මරණය දක්වා එනම් කුරුසියේ මරණය දක්වා පහත් වී කීකරු වූ සේක. එබැවින් දෙවියන් වහන්සේ උන්වහන්සේ අති උසස් තැනට නංවා, සියලු නාමයන්ට වඩා අග්‍රනාමය උන්වහන්සේට දුන් සේක.

## ශුද්ධවූ සුවිශේෂය

මාක් 14:1 - 15:47

**සුවිශේෂක මාක් තුමන් විසින් ලියා තිබෙන අයුරෙන් අප ස්වාමින් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ දුඃඛප්‍රාප්තිය මෙසේය.**

පාස්කුවට ද නුමුහුන් රොටි මංගල්‍යයට ද ඇත්තේ තව දෙදවසකි. නායක පූජකවරු ද විනයධරයෝ ද උන් වහන්සේ අල්ලා මැරීමට කපටි උපායක් සෙවූ හ. "එහෙත්, සෙනඟ අතර කලකෝලාහල ඇති නොවන පිණිස මංගල්‍යයේ දී එය සිදු නොකරමු"යි ඔව්හු කී හ. උන් වහන්සේ බෙතානියෙහි ලාදුරු රෝගී සීමොන්ගේ ගෙදර කෑමට හිඳගෙන සිටිය දී, එක් ස්ත්‍රියක් ඉතා අගනා සුපිරිසිදු සුවඳ විලවුන් පිරුණු කිරිගල් කරඬුවක් ගෙන'වුත්, එය බිඳ උන් වහන්සේගේ හිස මත ඒ සුවඳ විලවුන් වත් කළා ය. එහෙත් එහි සිටි ඇතැමෙක් කෝප වී, "මේ විලේපනය නාස්ති කෙළේ කුමට ද? මේ විලේපනය රිදී කාසි තුන්සියයකට වැඩියෙන් විකුණා, ඒ මුදල දිළිඳුන්ට දිය හැකි ව තිබුණේ ය"යි තම තමන් අතර කියාගනිමින් ඈට බැණ වැදුණෝ ය. එහෙත් ජේසුස් වහන්සේ කතා කොට, "ඈට නිකම් ඉන්න දෙන්න, ඈට කරදර කරන්නේ මන් ද? ඈ මා හට කෙළේ මනහර දෙයකි. දුගීහු ඔබ සමඟ හැම දා ම සිටිති. ඔබ කැමැති හැම විටක ම ඔවුන්ට යහපත කරන්න ඔබට පුළුවන. එහෙත්, මම හැම දා ම ඔබ සමඟ නොසිටිමි. ඇයට හැකි දෙය ඈ කළා ය. තැන්පත් කිරීම සඳහා, කල්තියා, ඈ මාගේ සිරුර ආලේප කර ඇත. සැබැවින් ම මම ඔබට කියමි, සුබ අස්න ලොව පුරා දේශනා කරනු ලබන හැම තැන්හි ම මේ ස්ත්‍රියගේ මේ ක්‍රියාව ද ඇය ගැන සැමරුමක් වශයෙන් කියනු ලැබේ ය"යි වදාළ සේක. දොළොස් දෙනාගෙන් එක් කෙනෙකු වූ ජූදස් ඉස්කාරියොත් ජේසුස් වහන්සේ නායක පූජකවරුන්ට පාවා දෙනු පිණිස ඔවුන් වෙතට ගියේ ය. ඔව්හු එපවත් අසා තුටුපහටු වී ඔහුට මුදල් දෙන්නට පොරොන්දු දුන්හ. එවිට ඔහු උන් වහන්සේ පාවා දෙන්න සුදුසු අවස්ථාවක් සෙවී ය. පාස්කු බැටළු පෝතකයා පූජා කරනු ලබන, නුමුහුන් රොටි මංගල්‍යයේ පළමු වන දින උන් වහන්සේගේ ශ්‍රාවකයෝ, "පාස්කු භෝජනය වළඳන පිණිස අප ගොස් කොතැන පිළියෙළ කරනවාට ඔබ කැමැති සේක් දැ"යි උන් වහන්සේගෙන් ඇසූ හ. එවිට උන් වහන්සේ තම ශ්‍රාවකයන් දෙදෙනෙකු යවමින්, "නුවරට යන්න; ගිය විට, වතුර කළයක් ගෙන යන මිනිසෙක් ඔබට හමු වන්නේ ය; ඔහු පස්සේ යන්න. ඔහු යම් ගෙදරකට ඇතුළු වන්නේ ද ඒ

ගෙහිමියාට කතා කොට, 'මාගේ ශ්‍රාවකයන් සමග පාස්කු භෝජනය වළඳන පිණිස මට වෙන් කළ කාමරය කොයි ද කියා සමිඳාණන් වහන්සේ අසන සේක'යි කියන්න. එවිට සකස් කොට සූදානම් ව ඇති ලොකු උඩුමහල් කාමරයක් ඔහු ඔබට පෙන්වනු ඇත. එහි අපට පාස්කු භෝජනය පිළියෙළ කරන්නැ"යි ඔවුන්ට වදාළ සේක. ශ්‍රාවකයෝ පිටත් ව නුවරට ගියහ. උන් වහන්සේ ඔවුන්ට කී ලෙස සියල්ල ම සම්බ විය; ඔව්හු ද පාස්කු භෝජනය පිළියෙළ කළහ.
සවස් වූ කල උන් වහන්සේ දොළොස් දෙනා කැටුව වැඩිය සේක. ඔවුන් වාඩි වී භෝජන වළඳමින් සිටිය දී ජේසුස් වහන්සේ, "සැබැවින් ම මම ඔබට කියමි, ඔබෙන් එක් කෙනෙක්; මා හා සමග වළඳන කෙනෙක්; මා පාවා දෙන්නේ ය"යි වදාළ සේක. ඔව්හු දුක් වන්නට ද, එක් එක්කෙනා "ඒ මම දැ"යි උන් වහන්සේගෙන් අසන්නට ද පටන්ගත්හ. උන් වහන්සේ ද පිළිතුරු දෙමින්, "ඒ තැනැත්තා දොළොස් දෙනාගෙන් එක් කෙනෙක් ය; මා සමග එක පාත්‍රයෙහි අත ලන තැනැත්තේ ය. ශුද්ධ ලියවිල්ලෙහි තමන් ගැන ලියා තිබෙන ලෙස ම මනුෂ්‍ය–පුත්‍රයාණෝ නියමිත ගමන යන සේක් ම ය; එහෙත් මනුෂ්‍ය–පුත්‍රයාණන් පාවා දෙන යම් මිනිසෙක් වේ ද ඔහුට වන විපතක මහත! ඒ මිනිසා නූපන්නේ නම් වඩා හොඳ ය"යි වදාළ සේක.
ඔවුන් ආහාර වළඳමින් සිටිය දී උන් වහන්සේ රොටි ගෙන, ආශීර්වාදය පවසා, ඒවා කඩා ඔවුන්ට දී, "ගන්න, මේ මාගේ ශරීරය ය"යි වදාළ සේක. උන් වහන්සේ කුසලානක් ද ගෙන, තුති පුදා, ඔවුන්ට දුන් සේක. සියල්ලෝම එයින් පානය කළහ. තවද උන් වහන්සේ ඔවුන්ට කතා කොට, "මෙය බොහෝ දෙනා වෙනුවෙන් වගුරුවනු ලබන මාගේ ගිවිසුම්–රුධිරය වේ. සැබැවින් ම මම ඔබට කියමි, දෙවියන් වහන්සේගේ රාජ්‍යයෙහි දී මම නැවත මිදියුස පානය කරන දිනය එන තෙක්, මම මේ මිදියුස යළිත් පානය නොකරන්නෙමි"යි වදාළ සේක. ඔව්හු ගීතයක් ගයා ඔලීව කන්දට නික්ම ගියහ.
තවද, ජේසුස් වහන්සේ කතා කරමින්, "ඔබ හැම දෙන ම පැකිළෙන්නහු ය; මන්ද, 'මම එඬේරාට පහර දෙන්නෙමි. එවිට බැටළුවෝ විසුරුවනු ලබන්නෝ ය'යි ලියා තිබේ. කෙසේ වුව ද උත්ථාන කරනු ලැබූ පසු, මම ඔබට පෙරටුව ගලීලයට යන්නෙමි"යි ඔවුන්ට වදාළ සේක. පේදුරු කතා කොට, "අන් හැම දෙනා ම අධෛර්යයට පත් වුණත්, මම නම් එසේ නොවන්නෙමි"යි උන් වහන්සේට කී ය. ජේසුස් වහන්සේ ද, "සැබැවින් ම මම ඔබට කියමි. අද ම, මේ රාත්‍රියේ දී ම කුකුළා දෙ වරක් හඬලන්න පෙර, මා හඳුනන්නේ නැතැ යි ඔබ තෙ වරක් කියන්නෙහි ය"යි ඔහුට වදාළ සේක. එහෙත්, ඔහු "මට ඔබ වහන්සේ සමග මැරෙන්න සිදු වුණත් 'ඔබ නාඳුනමි'යි කියන්නේ ම නැතැ"යි තරයේ ම කියා සිටියේ ය. සෙසු සියල්ලෝ ද එසේ ම කී හ.
ශ්‍රාවකයෝ ගෙත්සෙමන නම් වූ තැනට පැමිණියෝ ය. උන් වහන්සේ ද, "මා යාච්ඤා කරන අතර, ඔබ මෙහි සිටින්නැ"යි ශ්‍රාවකයන්ට වදාළ සේක. උන් වහන්සේ පේදුරු ද ජාකොබ් ද ජොහන් ද කැඳවාගෙන ගිය සේක. ඉන්පසු උන් වහන්සේ අතිශයින් බියපත් වන්න ද ශෝක වන්න ද පටන් ගත් සේක. උන් වහන්සේ ඔවුන් අමතා, "මැරෙණ තරමට මාගේ සිත අතිශයින් ශෝකාකුල ය; මෙහි නැවතී අවදි ව සිටින්න" කියා, මඳක් පෙරට ගොස් මුණින්තලා වී, හැකි නම්, ඒ පැය තමන් කෙරෙන් පහ ව යන ලෙස යාච්ඤා කරමින්, "අබ්බා, පියාණෙනි, ඔබට

සියල්ලක් ම හැකි ය; මේ කුසලාන මා කෙරෙන් ඉවත් කළ මැනව; එහෙත් මාගේ කැමැත්ත නොව, ඔබගේ කැමැත්ත වේ වා"යි වදාළ සේක.
පසුව උන් වහන්සේ අවුත්, ඔවුන් නිදා හිඳිනු දැක, පේදුරු අමතා, "සීමොන් ඔබ නිදි ද? පැයක් වත් අවදි ව ඉන්න ඔබට නොහැකි වූයේ ද? පරීක්ෂාවට නොවැටෙන පිණිස අවදි ව හිඳ යාච්ඤා කරන්න; හිත නම් කැමැතිය, එහෙත් ගත නම් දුබලය"යි වදාළ සේක.
උන් වහන්සේ යළිත් ගොස් එම වචන ම පවසමින් යාච්ඤා කළ සේක. ඉන්පසු නැවතත් හැරී අවුත් ඔවුන් නිදා හිඳිනු දුටු සේක. ඔවුන්ගේ ඇස් නිදිබර ව තිබිණි. උන් වහන්සේට කුමන පිළිතුරක් දෙන්න දැ යි ඔව්හු නොදත්හ.
උන් වහන්සේ තෙ වන වරත් අවුත් ඔවුන් අමතමින්, "තවමත් නිදි ද? තවමත් විවේකයෙන් ද? ඉතින් ඇති; නියමිත මොහොත පැමිණ තිබේ; මෙන්න, මනුෂ්‍ය–පුත්‍රයාණෝ පව්වුන්ගේ අත්වලට පාවා දෙනු ලබන සේක; නැඟිටින්න; අපි යමු; මෙන්න මා පාවා දෙන්නා ළඟ ම ය"යි වදාළ සේක.
ජේසුස් වහන්සේ කතා කරමින් සිටිය දී, දොළොස් දෙනාගෙන් කෙනෙකු වූ ජූදස් ද ඔහු කැටුව නායක පූජකවරු ද විනයධරයන් හා ප්‍රජා මූලිකයන් විසින් එවන ලද සමූහයක් ද කඩු මුගුරු රැගෙන ආහ. "මම යමෙකු සිඹිම් ද ඒ ඔබ සොයන තැනැත්තා ය. ඔහු අල්ලා පරෙස්සමින් ගෙන යන්න" කියා උන් වහන්සේ පාවා දෙන්නා ඔවුන්ට ලකුණක් දී තිබිණි.
ජූදස් අවුත් වහා ම උන් වහන්සේ වෙත ගොස්, "රබ්බී" කියා උන් වහන්සේ සිඹගත්තේ ය. ඔව්හු උන් වහන්සේ අල්ලාගෙන අත්අඩංගුවට ගත්හ. ළඟ සිටි අයගෙන් කෙනෙක් කඩුව ඇද මහා නායක පූජකවරයාගේ දාසයාට ගසා ඔහුගේ කන කපාලී ය. ජේසුස් වහන්සේ ඔවුන්ට උත්තර දෙමින්, "ඔබ සොරෙකුට විරුද්ධ ව මෙන් කඩු මුගුරු ගෙන මා අල්ලන්න ආවාහු ද? මම දිනපතා ම දේව මාලිගාවෙහි අනුශාසනා කරමින් ඔබ සමඟ සිටියෙමි; එහෙත් ඔබ මා අල්ලා නොගත්තහු ය; මෙසේ වන්නේ ශුද්ධ ලියවිල්ලේ ලියා ඇති දේ සම්පූර්ණ වන පිණිස ය"යි වදාළ සේක. එවිට සියල්ලෝ ම උන් වහන්සේ හැරපියා පලා ගියහ.
සිහින් හණ රෙද්දක් පමණක් පොරවාගත් තරුණයෙක් උන් වහන්සේ පසුපස්සේ ගියේ ය. ඔව්හු ඔහු අල්ලාගත්හ. එහෙත්, ඔහු ඒ රෙද්ද හැර දමා නග්න ව පලා ගියේ ය.
ඔව්හු ජේසුස් වහන්සේ උත්තම පූජකයා වෙත ගෙන ගියහ. සියලු නායක පූජකවරු ද ප්‍රජා මූලිකයෝ ද විනයධරයෝ ද එහි රැස් වූ හ. පේදුරු ද උත්තම පූජකයාගේ මළුව දක්වා ම දුරින් උන් වහන්සේ පසුපස්සේ ගියේ ය. ඔහු මුර සේවකයන් සමඟ වාඩි වී ගිනි තපිමින් සිටියේ ය. නායක පූජකවරු ද මුළු ශ්‍රේෂ්ඨාධිකරණය ද ජේ සුස් වහන්සේ මරණයට පත් කරවන පිණිස උන් වහන්සේට විරුද්ධ ව සාක්ෂි සෙවූ හ. එහෙත්, කිසි සාක්ෂියක් සම්බ නො වී ය. බොහෝ දෙනෙකු උන් වහන්සේට විරුද්ධ ව බොරු සාක්ෂි කී නමුත්, ඔවුන්ගේ සාක්ෂි එකට එකක් නොගැළපිණි.
එවිට සමහරු ඉදිරිපත් වී උන් වහන්සේට විරුද්ධ ව බොරු සාක්ෂි කියමින්, " 'මිනිස් අතින් තැනූ මේ දේව මාලිගාව බිඳදමා අතින් නොතැනූ අනිකක් මම තෙ

දිනකින් ගොඩනගමි'යි මොහු කියනු අපි ඇසීමු"යි කී හ. එහෙත්, මේ ලෙසින් ද ඔවුන්ගේ සාක්ෂි එකට එක විරුද්ධ විය.

උත්තම පූජකයා ද ඔවුන් ඉදිරියෙහි නැගිට, "ඔබ පිළිතුරක් දෙන්නේ නැද් ද? මොවුන් ඔබට විරුද්ධ ව ගෙනෙන සාක්ෂි මොනවා දැ"යි ජේසුස් වහන්සේගෙන් ඇසී ය. එහෙත්, ජේසුස් වහන්සේ නිශ්ශබ්ද ව කිසි පිළිතුරක් නොදී සිටි සේක. යළිත් උත්තම පූජකයා කතා කොට, "ඔබ ක්‍රිස්තුවරයාණෝ ද? ආශීර්වාදිතයාණන්ගේ පුත්‍රයාණෝ දැ"යි උන් වහන්සේගෙන් ඇසී ය. ජේසුස් වහන්සේ ද, "එසේ ය, තවද මනුෂ්‍ය–පුත්‍රයාණන් බලපරාක්‍රමයාණන්ගේ දකුණු පස වැඩහිඳිනවාත්, අහසේ වලාකුළු පිරිවරා වඩිනවාත් ඔබ හැම දකිනු ඇතැ"යි වදාළ සේක. එකල උත්තම පූජකයා තම සළුව ඉරාගෙන, "තවත් සාක්ෂිකරුවන්ගෙන් අපට මොන වැඩක් ද? දේවාපහාසය ඔබට ම ඇසුණේ ය; ඔබේ තීරණය කිමෙක් දැ"යි ඇසුවේ ය. සියල්ලෝ ම ඒකමතික ව උන් වහන්සේ මරණයට සුදුස්සෙකැ යි එකහෙළා තීරණය කළහ.

එකල ඇතැමෙක් උන් වහන්සේට කෙළ ගසන්නට ද උන් වහන්සේගේ මුහුණ වසා අතින් පහර දෙමින්, "ඉතින් දිවැසින් කියන්නැ"යි උන් වහන්සේට කියන්නට ද පටන්ගත්හ. මුර සේවකයෝ ද උන් වහන්සේ භාරගෙන, අතුල් පහර දුන්හ.

පේදුරු, පහළ මළුවේ සිටිය දී, උත්තම පූජකයාගේ එක් සේවිකාවක් අවුත් පේදුරු ගිනි තපිනු දැක ඔහු දෙස හොඳින් බලා, "ඔබත් නාසරෙත්හි ඒ ජේසුස් සමඟ සිටියෙහි ය"යි කීවා ය. ඔහු අපලාප කරමින්, "ඔබ කියන දේ කුමක් දැ යි මම නොදනිමි, මට නොතේරේ" කියා නික්ම, ද්වාර මණ්ඩපයට ගියේ ය. එකල කුකුළා හැඬලී ය. ඒ තරුණිය නැවතත් ඔහු දැක, "මොහු ඔවුන්ගෙන් කෙනෙකැ"යි ළඟ සිටියවුන්ට කියන්නට පටන් ගත්තා ය. එහෙත් ඔහු යළිත්, "නැතැ"යි කීවේ ය. මඳ වේලාවකට පසු නැවතත් ළඟ සිටි අය, "සැබැවින් ම ඔබ ඔවුන්ගෙන් එක් කෙනෙක් ම ය, ඔබත් ගලීලයෙක් ම ය"යි පේදුරුට කී හ. එහෙත් ඔහු, "ඔබ කියන ඒ මනුෂ්‍යයා මම නාඳුනමි"යි කියමින් තමාට ම සාප කරගන්නට ද දිවුරන්නට ද පටන්ගත්තේ ය. එකෙණෙහි ම කුකුළා දෙ වන වර හැඬලී ය. පේදුරු ද, "කුකුළා දෙ වරක් හඬලන්නට පළමු, 'ඔහු නාඳුනමි'යි ඔබ තෙ වරක් මා ගැන කියන්නෙහි ය"යි ජේසුස් වහන්සේ තමාට පැවසූ කීම සිහි කොට මහ හඬින් හැඬී ය.

පහන් වූ කෙණෙහි ම නායක පූජකවරු, ප්‍රජා මූලිකයන් ද විනයධරයන් ද මුළු ශ්‍රේෂ්ඨාධිකරණය ද සමඟ මන්ත්‍රණය කොට ජේසුස් වහන්සේට විලංගුදමා ගෙන ගොස්, පිලාත් හට භාර දුන්හ. පිලාත් ද, "ජුදෙව්වරුන්ගේ රජ ඔබ දැ"යි උන් වහන්සේගෙන් ප්‍රශ්න කෙළේ ය. උන් වහන්සේ උත්තර දෙමින්, "එසේ කියන්නේ ඔබ ය"යි වදාළ සේක. නායක පූජකවරු බොහෝ දේ ගැන උන් වහන්සේට චෝදනා කළහ. පිලාත් නැවත කතා කොට, "ඔබ කිසි ම පිළිතුරක් දෙන්නේ නැද් ද? බලන්න, මොවුහු ඔබට කෙතරම් චෝදනා කරත් දැ"යි උන් වහන්සේට කී ය. එහෙත්, ජේසුස් වහන්සේ ඉන්පසු කිසි පිළිතුරක් නුදුන් සේක. ඒ ගැන පිලාත් ද මවිත විය.

මංගල්‍යයේ දී සෙනඟ ඉල්ලා සිටින හිරකරුවෙකු නිදහස් කරදීම, පිලාත්ගේ සිරිත විය. කැරලි කෝලාහල කොට, මිනී මැරීමේ වරදට හිර කරනු ලැබූ කැරලිකරුවන් අතර බරබ්බස් නම් කෙනෙක් විය. සමූහයා එක් ව ගොස්, පෙරසිරිත ඉටු කරන ලෙස පිලාත්ගෙන් අයැදින්නට පටන්ගත්හ. පිලාත් උත්තර දෙමින්, "මා

ජුදෙව්වරුන්ගේ රජු නිදහස් කර දෙනවාට ඔබ කැමැති දැ"යි ඔවුන්ගෙන් ඇසී ය. එසේ කෙළේ, නායක පූජකවරුන් ඊර්ෂ්‍යාවෙන් උන් වහන්සේ පාවා දුන් බව ඔහුට වැටහී තිබුණු බැවිනි. එහෙත්, උන් වහන්සේ වෙනුවට බරබ්බස් නිදහස් කර දෙන ලෙස ඉල්ලන්න නායක පූජකවරු ජනයා පෙළඹවූ හ. පිලාත් ඔවුන්ට නැවත පිළිතුරු දෙමින්, "එසේ නම්, 'ජුදෙව්වරුන්ගේ රජ ය'යි ඔබ කියන මොහු ගැන කුමක් කරන්න දැ"යි ඇසී ය. "කුරුසියෙහි ඇණ ගසන්නැ"යි ඔව්හු යළිත් මොරගැසූ හ. එකල පිලාත්ධ "කිමෙක් ද? මොහු කුමන අපරාධයක් කෙළේ දැ"යි ඔවුන්ගෙන් ඇසී ය. එහෙත් ඔව්හු "කුරුසියෙහි ඇණ ගසන්නැ"යි වැඩි වැඩියෙන් මොරගැසූ හ. පිලාත් ජනතාව සතුටු කරන්නට කැමැති ව, බරබ්බස් ඔවුන්ට නිදහස් කර දී, ජේ සුස් වහන්සේට කසයෙන් තළවා, කුරුසියෙහි ඇණ ගසනු පිණිස භාර දුන්නේ ය.
මුර සෙබළෝ උන් වහන්සේ ප්‍රෙතෝරියම් නම් රජ වාසලට ගෙන ගොස් මුළු සේනාංකය රැස් කරවූ හ. ඔව්හු උන් වහන්සේට නීල-රක්ත වස්ත්‍රයක් හඳවා, කටු කිරුළක් ගොතා උන් වහන්සේගේ හිස මත තබා, "ජුදෙව්වන්ගේ රජුනි, සැරදේ!" කියා උන් වහන්සේට ආචාර කරන්න පටන් ගත්හ. ඔව්හු බට දණ්ඩකින් උන් වහන්සේගේ හිසට ගසා, උන් වහන්සේට කෙළ ගසා, දණ නමා උන් වහන්සේ ඉදිරියෙහි වැඳ වැටුණාහ. උන් වහන්සේට ගැරහුම් කළ පසු ඔව්හු නීල-රක්ත වස්ත්‍රය ගලවා, උන් වහන්සේගේ ම ඇඳුම් අන්දවා, කුරුසියෙහි ඇණ ගසනු පිණිස ගෙන ගියහ.
අලෙක්සන්දර්ගේ ද රූපස්ගේ ද පිය වූ පිටිසරින් ආ සිරේනියේ සීමොන් නම් මඟියෙකුට උන් වහන්සේගේ කුරුසිය උසුලාගෙන යන්න ඔව්හු බල කළහ. ඔව්හු කපාලපිටිය යන අර්ථ ඇති 'ගොල්ගොතා' නම් තැනට උන් වහන්සේ ගෙන ගියහ. සුවඳලාටු මුසු මුද්‍රික පානය උන් වහන්සේට දෙන ලද්දේ ය. එහෙත්, උන් වහන්සේ එය නොපිළිගත් සේක. ඔව්හු උන් වහන්සේ කුරුසියෙහි ඇණ ගසා, උන් වහන්සේගේ ඇඳුම් තම තමන් අතර බෙදාගනිමින්, එක් එක්කෙනා කුමක් ගන්න දැ යි බලන පිණිස ඒවා ගැන දාදු දැමූ හ. ඔවුන් උන් වහන්සේ කුරුසියෙහි ඇණ ගැසුවේ හිරු උදා වී තුන් පැයකට පසුව ය. "ජුදෙව්වරුන්ගේ රජ ය"යි උන් වහන්සේ පිළිබඳ චෝදනා පුවරුව ලියා තිබිණි.තවද, ඔව්හු සොරුන් දෙදෙනෙකු එක් කෙනෙකු දකුණු පසෙහි ද එක් කෙනෙකු වම් පසෙහි ද උන් වහන්සේ සමඟ කුරුසියෙහි ඇණ ගැසූ හ. 'උන් වහන්සේ අපරාධකරුවන් සමඟ ගණන්ගනු ලැබූ සේක' යන ශුද්ධ ලියවිල්ල මෙසේ ඉටු විය.
මඟ යන අය හිස් වන වනා උන් වහන්සේට අපහාස කරමින්, "හහා! දේව මාලිගාව වනසාදමා තෙදිනකින් එය ගොඩනගන ඔබ ම, ගැළවී කුරුසියෙන් බැස එන්නැ"යි කී හ. එලෙස ම නායක පූජකවරු විනයධරයන් සමඟ තම තමන් අතර උන් වහන්සේට කවටකම් කරමින්, "මොහු අනුන් ගැළවී ය, එහෙත් තමා ම ගළවාගන්නට මොහුට නොහැකි ය. අප විසින් දැක අදහන පිණිස, ඉශ්රායෙල්හි රජ වන ක්‍රිස්තුස් දැන් කුරුසියෙන් බසින්නැ"යි කී හ. උන් වහන්සේ සමඟ කුරුසියෙහි ඇණ ගසනු ලැබුවෝ ද උන් වහන්සේට ගැරහුම් කළහ.
මද්දහනේ දී රට පුරා අන්ධකාරයක් පහළ විය. එය සවස තුන වන තෙක් පැවතිණි. සවස තුනට ජේසුස් වහන්සේ, "එලොයි, එලොයි, ලාමා සබක්(ත්)තානි" කියා මහ හඬින් මොරගැසූ සේක. එහි අර්ථය, "මාගේ දෙවියනි, මාගේ දෙවියනි,

ඔබ මා අත් හැරියේ මක්නිසා ද?" යනුයි. බලා සිටිය අයගෙන් සමහරෙක් ඒ අසා, "අන්න, ඔහු එලියාට හඬගසයි" කී හ. කෙනෙක් දිව ගොස් මුදුහත්තක් විනාකිරෙහි පොගවා, බට ලීයක ගසා උන් වහන්සේට බොන්න දී, "ටිකක් ඉන්න, මොහු බස්වාලීමට එලියා එන්නේ ද කියා බලමු"යි කී හ. ජේසුස් වහන්සේ මහ හඬක් නගා අවසන් හුස්ම මුදා හැරිය සේක.

එවිට දේව මාලිගාවේ තිරය ඉහළ පටන් පහළ දක්වා දෙකට ඉරී ගියේ ය. උන් වහන්සේ අබිමුවෙහි සිටි ශතාධිපතියා උන් වහන්සේ මෙසේ අවසන් හුස්ම හළ බව දුටු කල, "සැබැවින් ම මේ මනුෂ්‍යයා දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝ ම ය"යි කී ය. ස්ත්‍රීහු ද දුරින් බලා සිටියහ. ඔවුන් අතර, ගලීලයේ සිටිය දී උන් වහන්සේ පිරිවරා ගොස් උපස්ථාන කළ මග්දලායේ මරියාත්, කුඩා ජාකොබ්ගේ ද ජෝසෙප්ගේ ද මව වූ මරියාත්, සලෝමිත්, උන් වහන්සේ සමග ජෙරුසලමට ආ බොහෝ කාන්තාවෝත් සිටියහ.

එය සබතට පෙර සූදානම් වීමේ දිනය වූ බැවින්, හිරු බැස ගිය කල, ජුදා මන්ත්‍රණ සභාවෙහි ගරුතර සාමාජිකයෙකු වන, දෙවියන් වහන්සේගේ රාජ්‍යය ගැන අපේක්ෂාවෙන් සිටි, අරිමාතියේ ජෝසෙප් එහි පැමිණ, ධෛර්ය ගෙන, පිලාත් වෙත ගොස් ජේසුස් වහන්සේගේ මෘත දේහය ඉල්ලා සිටියේ ය. පිලාත් ද උන් වහන්සේ එතරම් ඉක්මනින් මියගිය බව අසා පුදුම වී, ශතාධිපතියා කැඳවා, "උන් වහන්සේ මේ ඉක්මනින් මළ සේක් දැ"යි ඇසී ය. ඒ බව ශතාධිපතියාගෙන් සහතික ලෙස දැනගත් පසු පිලාත් තෙමේ ජෝසෙප්ට මෘත දේහය බාර දුන්නේ ය. ඔහු හණ රෙද්දක් මිලට ගෙන, උන් වහන්සේ පහතට බා, ඒ රෙද්දෙන් ඔතා, පර්වතයෙහි කණින ලද සොහොන් ගැබක තබා, දොරකඩට ගලක් පෙරළා තැබී ය. මග්දලායේ මරියා ද ජෝසෙප්ගේ මව වූ මරියා ද උන් වහන්සේ තැන්පත් කළ ස්ථානය බලාගත්හ.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.lk/ වෙත පිවිසෙන්න.